

2023

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අරමුදල
இலங்கை சுற்றுலா அபிவிருத்தி நிதியம்
SRI LANKA TOURISM DEVELOPMENT FUND

ශ්‍රී ලංකා සංචාරක
සංවර්ධන අරමුදල

වාර්ෂික වාර්තාව
2023



Sri Lanka
YOU'LL COME BACK FOR MORE



ගරු හරීන් ප්‍රනාන්දු
සංචාරක හා ඉඩම් අමාත්‍ය

ගරු ඇමතිතුමනි,
සංචාරක සංවර්ධන අරමුදල සඳහා යොමුව

2005 අංක 38 දරන සංචාරක පනතේ 23(1) වගන්තිය යටතේ සංචාරක සංවර්ධන අරමුදල ස්ථාපිත කර ඇති බව කාරුණික දැනුම්දීමට කැමැත්තෙමි. මෙම අරමුදල සංචාරක කර්මාන්තයේ සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා යෙදවිය යුතුය. බදු අයකිරීමේ ක්‍රමය මෙන්ම එය බෙදා හැරීම පිළිබඳ විස්තර මෙම පනතේ දක්වා ඇත.

2005 අංක 38 දරන සංචාරක පනතේ 23(2) වගන්තියට අනුව, සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් අපගමන බද්දෙන් (සංචාරක අපගමන බදු) 1/3 ක් (ඇ.ඩො. 5 ට සමාන) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවනු ලැබේ.

විපමණක් නොව, සංචාරක සංවර්ධන බද්ද නමින් තවත් බද්දක් සංචාරක ව්‍යාපාරයට අදාළ ව්‍යාපාරවලින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් අය කරනු ලැබේ.

සංචාරක සංවර්ධන අරමුදල යනු සංචාරක අපගමන බදු සහ සංචාරක සංවර්ධන බදු යන දෙකේම එකතුව වේ.

2005 අංක 38 දරන සංචාරක පනතේ දක්වා ඇති ප්‍රතිශතයට අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සහ ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය වෙත සංචාරක සංවර්ධන අරමුදල බෙදා හරිනු ලැබේ.

2022 වසර සඳහා සංචාරක සංවර්ධන අරමුදල රු. මිලියන 4,037.87 ක් වූ අතර 2023 වසර සඳහා එය රු. මිලියන 5,798.14 කි.

මෙම වාර්තාවේ 2022 සහ 2023 වසර තුළ සංචාරක සංවර්ධන අරමුදල අය කිරීම සහ බෙදා හැරීම පිළිබඳ සංසන්දනාත්මක විස්තර ඇතුලත් වේ.

ස්තූතියි,
මෙයට විශ්වාසී

අත්සන් කළේ:
ප්‍රියන්ත ප්‍රනාන්දු
සභාපති - ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය



A.	හැඳින්වීම	4
B.	මූල්‍ය සමාලෝචනය	5
C.	සංචාරක සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රකාශ	6-11
	2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය	7
	2023 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	8
	හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය	9
	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	10
	2023 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය	10
	ගිණුම්වලට අදාළ සටහන්	11
	02. ගිණුම්කරණ අවශ්‍යතා	11

භාවිතා කරන ලද කෙටි යෙදුම්

EL	-	සංචාරක අපගනම බදු
SLCB	-	ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය
SLITHM	-	ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
SLTDA	-	ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
SLTPB	-	ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය
TDF	-	සංචාරක සංවර්ධන අරමුදල
TDL	-	සංචාරක සංවර්ධන බදු



අ

හැඳින්වීම

2005 අංක 38 දරන සංචාරක පනතේ 23 (1) වගන්තිය යටතේ TDF පිහිටුවා ඇති අතර මෙම අරමුදල සංචාරක ව්‍යාපාරයේ සංවර්ධනය හා ප්‍රවර්ධනය සඳහා යොදා ගත යුතුය. TDF කළමනාකරණ සහ පරිපාලන කටයුතු සිදු කරනු ලබන්නේ SLTDA විසිනි.

2005 අංක 38 දරන සංචාරක පනතේ 23 (2) වගන්තියට සහ 2003 අංක 25 දරන මුදල් පනතේ 2 (1) වගන්තියට අනුව සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් අය කරන ලද අපගමන බද්දෙන් තුනෙන් එකක් TDF වෙත ගෙවනු ලැබේ. තවද, 2003 අංක 25 දරන මුදල් පනතේ 12 වැනි වගන්තියට අනුව SLTDA හි අධ්‍යක්ෂ ජනරාල් විසින් අය කරන ලද TDL සෑම ලියාපදිංචි සංචාරක ආයතනයකින්ම TDF වෙත ප්‍රේෂණය කරනු ලැබේ. 2005 අංක 38 දරණ සංචාරක පනතේ 24 (8) වගන්තියට අනුව, TDF හි බැර කිරීමට ඇති සියලුම මුදල් පහත පරිදි බෙදා හැරිය යුතුය.


අ) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සඳහා 70% ක මුදලක්
ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සඳහා 14% ක මුදලක්
ඇ) ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය සඳහා 12% ක මුදලක්
ඈ) ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සඳහා 4% ක මුදලක්

2023 වසර තුළ සංචාරක සංවර්ධන අරමුදලට ලද මුදල් හා එම මුදල් බෙදාහරින ලද ආකාරය පිළිබඳ විස්තර මෙම වාර්තාවේ අන්තර්ගත වේ.


ආ

මූල්‍ය සමාලෝචනය

ප්‍රස්ථාරය 1 :
ආදායම් විශ්ලේෂණය



ප්‍රස්ථාරය 2: 2023 වසරට සංචාරක සංවර්ධන බද්ද දායකත්වය



සංචාරක සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රකාශ

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ගිණුම් වලට අදාළ සටහන්

සංචාරක සංවර්ධන අරමුදල
2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන් අංකය.	2023 (රු)	2022 (රු)
ජංගම වත්කම්			
මුදල් හා මුදල්වලට සමාන දේ	3	2,401,846,704	830,349,897
ලැබිය යුතු මුදල්	4	897,777,529	889,139,868
මුළු වත්කම්		**3,299,624,233**	**1,719,489,764**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු මුදල්	5	899,936,725	130,962,865
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය		335,956,251	222,393,766
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය		1,679,781,256	1,111,968,829
ශ්‍රී ලංකා හෝටල් කළමනාකරණ ආයතනය		287,962,501	190,623,228
ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය		95,987,500	63,541,076
මුළු වගකීම්		**3,299,624,233**	**1,719,489,764**

පිටු 05 සිට 08 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල අනිවාර්ය අංගයක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ. මෙම මූල්‍ය ප්‍රකාශ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.

සම්පත් ගනේපලආරච්චි
අධ්‍යක්ෂ මූල්‍ය කළමනාකරණ

ප්‍රියන්ත ප්‍රනාන්දු
සභාපති

බී එච් ආර් සරිගෝඩින්
අධ්‍යක්ෂ ජනරාල්

නිශාන්ත කුරේ
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

සංචාරක සංවර්ධන අරමුදල
2023 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

	සටහන් අංකය.	2023 (රු)	2022 (රු)
ආදායම්			
සංචාරක සංවර්ධන බදු සහ අපගමන බදු	6	5,798,146,710	4,037,871,205
වෙනත් ආදායම්	7	124,499,691	44,145,468
මුළු ආදායම්		**5,922,646,401**	**4,082,016,673**
වියදම්			
පරිපාලන වියදම	8	7,805,658	7,753,673
මූල්‍ය වියදම	9	4,366,568	2,483,715
අරමුදලේ බෙදා හැරීම	10	5,891,955,580	4,057,665,139
සංචාරක සංවර්ධන බද්දෙන් භාණ්ඩාගාරයට ප්‍රේෂණ කරනු ලබන 0.5% ප්‍රමාණය	11	18,518,596	14,114,147
මුළු වියදම්		**5,922,646,401**	**4,082,016,673**
වර්ෂය සඳහා අතිරික්තය/(හිඟය)		**-**	**-**

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

2023 අංක 25 දරණ මූල්‍ය පනත සහ 2005 අංක 38 දරණ සංචාක පනතට අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කළමණාකරණය සහ පරිපාලනය සඳහා සංචාරක සංවර්ධන අරමුදල ස්ථාපිත කර ඇත. ඒ බැවින් සංචාරක සංවර්ධන අරමුදල සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයක් සකස් කරනු නොලැබේ.


2005 අංක 38 සංචාරක පනතේ (24) (8) (අ) වගන්තිය මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි මුළු ශුද්ධ ආදායම් ආයතන හතර අතර පහත දැක්වෙන ආකාරයට බෙදා හරිනු ලැබේ.

(a) 2005 අංක 38 දරණ සංචාරක පනත

ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය	(SLTPB)	70%
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	(SLTDA)	14%
ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය	(SLITHM)	12%
ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය	(SLCB)	04%

මුදල් ප්‍රවාහ ප්‍රකාශය
“මුදල් ප්‍රවාහ ප්‍රකාශය” සකස් කර ඉදිරිපත් කිරීමට “සෘජු ක්‍රමය” අනුගමනය කරන ලදී.

ප්‍රස්ථාර 3 - ඉහත ආයතන අතර සංචාරක සංවර්ධන අරමුදල බෙදාහරින ලද ප්‍රතිශතයන්



සංචාරක සංවර්ධන අරමුදල
2023 දෙසැම්බර් 31 න් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන් අංකය.	2023 (රු)	2022 (රු)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වන මුදල් ප්‍රවාහය			
ලැබීම්			
සංචාරක සංවර්ධන බදු සහ අපගමන බදු		**5,791,043,116**	**3,532,669,408**
වෙනත් ලැබීම්		**883,226,763**	**44,616,312**
ගෙවීම්			
අරමුදලේ බෙදා හැරීම්		**(5,080,794,971)**	**(3,269,070,316)**
වෙනත් ගෙවීම්		**(21,978,101)**	**(25,486,183)**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වන ශුද්ධ මුදල් ප්‍රවාහය		**1,571,496,807**	**282,729,221**
මුදල් හා මුදල් සමාන දැහි ආරම්භක ශේෂය		**830,349,897**	**547,620,676**
මුදල් හා මුදල් සමාන දැහි අවසාන ශේෂය		**2,401,846,704**	**830,349,897**
මුදල් හා මුදල්වලට සමාන දේ ඇති ශුද්ධ අඩුවීම/(වැඩිවීම)		**1,571,496,807**	**282,729,221**

ගිණුම්වලට අදාළ සටහන්

01 සංචාරක සංවර්ධන අරමුදල

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (I) වගන්තිය යටතේ "සංචාරක සංවර්ධන අරමුදල්" නමින් අරමුදලක් ස්ථාපිත කර ඇති අතර 2023 අංක 25 දරණ මූල්‍ය පනත සහ 2005 අංක 38 දරණ සංචාරක පනතට අනුකූලව සංචාරක සංවර්ධන අරමුදල රැස්කිරීම සහ බෙදාහැරීම සිදු කල යුතුය.

02 ගිණුම්කරණ අවශ්‍යතා

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව අරමුදල් ගිණුම් සකස් කර ඇත.

03 මුදල් හා මුදල්වලට සමාන දේ

	2023 (රු)	2022 (රු)
මුදල් හා මුදල්වලට සමාන දේ		
ලංකා බැංකුවේ ගිණුම් අංක 7122882	1,281,002,577	(575,721,381)
ලංකා බැංකුවේ සෘජු තැන්පතු ගිණුම් අංක 73104820	270,844,127	156,071,278
ස්ථාවර තැන්පතු - මාස 1 කල්පිරීම (2022/2023)	600,000,000	1,250,000,000
ස්ථාවර තැන්පතු - මාස 3 කල්පිරීම (2023)	250,000,000	-
එකතුව	**2,401,846,704**	**830,349,897**

03.1 ස්ථාවර තැන්පතු - මාසයක / මාස තුනක කල්පිරීම

සංචාරක සංවර්ධන බදු ඒකකයේ ඇති වූ නොවැළැක්විය හැකි තත්වයක් හේතුවෙන්, අය කරන ලද සංචාරක බදු සහ අපගමන බදු ආදායම නියමිත වේලාවට බෙදා දීමට නොහැකි විය. එබැවින්, පොලී ඉපැයීමකින් තොරව ජංගම ගිණුමක නිෂ්ක්‍රීය අරමුදල් තබාගැනීම වැළැක්වීමේ අරමුණින් එකතු කරන ලද අරමුදල් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ස්ථාවර තැන්පතුවක තාවකාලිකව ආයෝජනය කරන ලදී.

04 ලැබිය යුතු මුදල්

	2023 (රු)	2022 (රු)
ලැබිය යුතු සංචාරක සංවර්ධන බදු	450,000,000	350,000,000
ලැබිය යුතු අපගමන බදු	435,565,072	536,533,176
විවිධ ණය ගැතියන්	3,872,876	-
අගරු චෙක්පත් ගාස්තු	8,339,581	2,606,692
එකතුව	**897,777,529**	**889,139,868**

05 ගෙවිය යුතු මුදල්

	2023 (රු)	2022 (රු)
ගෙවිය යුතු මුදල්		
සංචාරක සංවර්ධන අරමුදලේ ඇතුලත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරි සමඟ ජංගම ගිණුම	1,836,332	2,002,988
උපචිත වියදම්-පරිපාලන ගාස්තු	5,059,309	4,756,876
උපචිත වියදම්-විගණන ගාස්තු	302,910	249,000
උපචිත වියදම් - මුද්දර ගාස්තු	134,250	32,350
වෙනත් ජංගම වගකීම් (හඳුනා නොගත්)	876,828,957	116,567,818
සංචාරක සංවර්ධන බද්දෙන් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරනු ලබන 0.5%ක ප්‍රමාණය	15,774,967	7,353,833
එකතුව	**899,936,725**	**130,962,866**

06 බදු - අරමුදල් මූලාශ්‍ර

	2023 (රු)	2022 (රු)
සංචාරක සංවර්ධන බදු (1%)	1,455,302,520	1,425,896,499
සංචාරක සංවර්ධන බද්දෙන් 0.5% එකතුව	18,518,596	14,114,147
අපගමන බදු	4,324,325,594	2,597,860,560
එකතුව (අපගමන බදු + සංචාරක සංවර්ධන බදු)	**5,798,146,710**	**1,302,233,847**

06.1 අපගමන බදු

සංචාරක පනතේ 23 (2) (අ) වගන්තියට අනුව, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (SLCAA) එකතු කරන ලද මුදලින් 1/3 ක් අපගමන බද්ද මගින් ශ්‍රී ලංකා සංචාරක අධිකාරිය වෙත ගෙවිය යුතුය. කෙසේ වෙතත්, වර්තමානයේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ඒ අනුව නොලැබෙන අතර, ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් අපගමන බද්ද මාර්ගයෙන් එකතු කරන ලද මුදලින් 1/3 ට සමාන නොවන, ඇ.ඩොලර් 5 ට සමාන ශ්‍රී ලංකා රුපියල් අගයක් පමණක් ලබා ගනී.

වර්ෂය සඳහා අපගමන බදු ආදායම	2023 (රු)	2022 (රු)
ලැබුණු මුදල	3,888,760,547	2,061,327,383
ලැබිය යුතු මුදල	435,565,047	536,533,151
මුළු අපගමන බදු	**4,324,325,594**	**2,597,860,560**

06.2 සංචාරක සංවර්ධන බදු (TDL)

2003 අංක 25 දරණ මූල්‍ය පනතට අනුව සංචාරක ක්ෂේත්‍රයට අදාළ ලියාපදිංචි සෑම සංචාරක සංවර්ධන බදු ගෙවිය යුතුය. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරක සංවර්ධන බදු අය කර එය සංචාරක සංවර්ධන අරමුදලට බැර කරයි. 2023 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුළ සංචාරක සංවර්ධන බදු එකතුව රුපියල් මිලියන 1,005 කි. තවද, 2023 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන කාර්තුව සඳහා TDL ගෙවීම්වල නියමිත දිනය 2024 මාර්තු 31 වන දින වන අතර, එබැවින් 2023 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා රුපියල් මිලියන 450 ක ඇස්තමේන්තුවක් සලසා ඇත.

වසර සඳහා සංචාරක සංවර්ධන බදු	2023 (රු)	2022 (රු)
ජනවාරි-දෙසැම්බර් සඳහා ලැබුණු මුදල	770,826,049	1,012,961,594
ඔක්තෝබර්-දෙසැම්බර් සඳහා ලැබිය යුතු මුදල	450,000,000	350,000,000
පසුගිය වසර සඳහා ඌන ප්‍රතිපාදන	235,266,067	64,619,807
ආපසු ගෙවනු ලබන TDL	(789,596)	(1,684,902)
ජනවාරි-දෙසැම්බර් සඳහා TDL එකතුව	**1,455,302,520**	**1,425,896,499**

07 අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් ලෙස ගිණුම්ගතකොට ඇති වටිනාකම තුල මූලිකව අන්තර්ගත වන්නේ 2003 අංක 25 දරණ මූල්‍ය පනත ප්‍රකාරව නියමිත දිනට ගෙවීම් නොකල ලියාපදිංචි ආයතනය හි ප්‍රමාද ගෙවීම් මත අයකල පොලී ආදායම වේ. මීට අමතරව, අක්‍රමවත් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරන ආයතන සඳහා 20% අධිභාරයක් පනවනු ලැබේ.

	2023 (රු)	2022 (රු)
20% අධිභාරය	906,921	1,367,734
බදු පමා කිරීමේ පොලී ආදායම	18,283,318	16,065,404
ස්ථාවර තැන්පතු පොලී	105,309,452	26,712,329
එකතුව	**124,499,691**	**44,145,467**

08 අරමුදලේ පරිපාලන වියදම්

	2023 (රු)	2022 (රු)
පරිපාලන ගාස්තුව	7,346,938	7,201,468
මුද්දර ගාස්තු	101,900	40,150
විගණන ගාස්තු	356,820	512,055
එකතුව	**7,805,658**	**7,753,673**

09 මූල්‍ය වියදම්


	2023 (රු)	2022 (රු)
බදු එකතු කිරීමේ බැංකු කොමිස් මුදල	4,249,025	2,417,205
අගරු චෙක්පත් ගාස්තු	420	510
බැංකු ගාස්තු (882 + 820)	117,123	60,000
බැංකු දෝෂ	-	6,000
එකතුව	**4,366,568**	**2,483,715**

10 සංචාරක සංවර්ධන බදු, අපගමන බදු සහ ස්ථාවර පොලී ගෙවීම් වියදම්

2005 අංක 38 සංචාරක පනතේ 24 (8) වගන්තිය අනුව ගෙවීම් විදම් සිදු කරන ලදී.

	2023 (රු)	2022 (රු)
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	824,873,781	568,073,119
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය	4,124,368,906	2,840,365,597
ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය	707,034,670	486,919,817
ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය	235,678,223	162,306,606
එකතුව	**5,891,955,580**	**4,057,665,138**

ප්‍රස්ථාර 4 - ඉහත ආයතන අතර 2022 හා 2023 වසර තුල සංචාරක සංවර්ධන අරමුදල බෙදාහිරින ලද ප්‍රමාණය (රු. මිලියනවලින්)



11 භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරනු ලබන 0.5%ක TDL

	2023 (රු)	2022 (රු)
සංචාරක සංවර්ධන බද්දෙන් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කරනු ලබන 0.5%ක ප්‍රමාණය	18,518,596	14,114,147
එකතුව	**18,518,596**	**8,480,072**

සටහන:- සංචාරක පනතේ 24 (1) වගන්තියේ සහ 2003 අංක 25 දරන මුදල් පනතේ 12 වගන්තියේ විධිවිධාන අනුව, SLTDA හි ලියාපදිංචි වී ඇති කාර්තුවකට මිලියන 3 ට වැඩි පිරිවැටුමක් (වර්ෂයකට රුපියල් මිලියන 12) උපයන සෑම ආයතනයක්ම සංචාරක සංවර්ධන බද්දෙන් (TDL) 1% ක් ගෙවිය යුතුය.

කෙසේ වෙතත්, 2003 අංක 25 දරන මුදල් පනතේ ii වන කොටස සංශෝධනය කිරීමේදී, 2019 ජනවාරි 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, කාර්තුවකට මිලියන 3 ට අඩු පිරිවැටුමක් (වර්ෂයකට රුපියල් මිලියන 12) උපයන සෑම ආයතනයක්ම සඳහා 0.5% අනුපාතයකින් සංචාරක සංවර්ධන බද්ද අයකර භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් වෙත විවිය යුතුය. ඒ අනුව මෙම සමාලෝචිත වර්ෂය තුළ 0.5% අනුපාතයකින් අය කරන ලද රුපියල් මිලියන 18.5ක TDL භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර ඇත.

12 වර්ෂය තුළ ලැබුණු සංචාරක සංවර්ධන බදු සහ අපගමන බදු

	2023 (රු)	2022 (රු)
වර්ෂය තුල මුළු සංචාරක සංවර්ධන බදු ලැබීම්	1,373,821,116	1,290,010,646
වර්ෂය තුල මුළු අපගමන බදු ලැබීම්	4,425,293,698	2,242,658,762
එකතුව	**5,799,114,814**	**3,532,669,408**

13 බෙදාහැරීම්

	2023 (රු)	2022 (රු)
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	711,311,296	457,669,844
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය	3,556,556,480	2,288,349,221
ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය	609,695,397	392,288,438
ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය	203,231,799	130,762,813
එකතුව	**5,080,794,971**	**3,269,070,316**



SRI LANKA TOURISM DEVELOPMENT AUTHORITY
No. 80, Galle Road, Colombo 03
Tel : +94 112426800 / +94 112426900
Fax : +94 112 444165 / 2426984
Web : www.sltda.gov.lk

PRINTEC | 0112 815 816